සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2024

5 ශ්‍රේණිය

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන පහ ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

I පත්‍රය

කාලය පැය 01 යි

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි


පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
අවසාන ලකුණු	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	
	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	
	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව සහතික කරමි.	
	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය.	
	V/II/S/CH


ලබා දෙන දිනය - 2024.06.11. පෙ.ව. 10.00 සිට පෙ.ව. 11.00 *[දෙවැනි පිටුව බලන්න.*

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි -

01. පහත ඇති A රූපයට වඩා B රූපයේ ඇති වෙනස්කම් ගණන කීය ද?




A රූපය




B රූපය

1. 3 කි 2. 4 කි 3. 5 කි

02. පහත රූපයේ A හා B ලෙස සටහන් කර ඇති හිස්තැනට පිළිවෙළින් ගැළපෙන රූප කොටස් දෙක මොනවා ද?




1.  

2.  

3.  

03. කොටුව තුළ ඇති රූපය සකස් කිරීමට ඒ අයුරින් ම යොදා ගත යුතු රූප තුන මොනවා ද?





A



B



C



D



E

1. BDE 2. ABE 3. BEC

04. පහත ඇති කවියෙහි හිස්තැන්වලට ගැළපෙන වචන පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

සිත ගත සනසන ..... ගෙන එන
මද නල තුරුලිය සිඹිමින් මෙහි එන
විඳිනට ..... කළ යුතු මහ පින
සුරැකුම ගහ කොළ නිති අප ..... මෙන

1. උණුසුම , නිතර , දණ
2. පණ , නිරතුරු , ඔබ
3. සිසිලස , නිරතුරු , පණ

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි -


05. වට්ටියක නිල් මල් 12 ක් ද සුදු මල් 8 ක් ද රතු මල් 13 ක් ද ඇත. සියානා වරකට නිල් මල් 2 ක් ද , සුදු මල් 1 ක් ද , රතු මල් 3 ක් ද බැගින් ඉවතට ගනු ලැබේ. එසේ ඉවතට ගනු ලබන වාර ගණන අවසන් වූ විට වට්ටියේ ඉතුරු වූ මල් ගණන කීය ද?

1. 8 යි 2. 9 යි 3. 10 යි

06. හරි මැදින් ඇමුණුම් කටු යොදා ඇති පිටු 40 ක අභ්‍යාස පොතක 13 සහ 14 පිටු අයත් කොළය මුළුමනින් ම ඉරා ඉවත් කරන ලදී. ඒ සමඟ පොතේ ගැළ වී යා හැකි අනෙක් කොළයට අයත් වන පිටු දෙක මොනවා ද?

1. 27 සහ 28 2. 25 සහ 26 3. 29 සහ 30


07. රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.



උදෑසන 8.00ට නයනා ගේට්ටුවෙන් නිවසට ඇතුළු වන විට නයනාගේ සෙවණැල්ල නයනාට ඉදිරියෙන් තිබුණේ නම් කොස් ගස පිහිටා ඇත්තේ නිවස පිහිටි භූමියේ කුමන දිශාවෙන් ද?

1. උතුරු දිශාවෙන් 2. නැගෙනහිර දිශාවෙන් 3. දකුණු දිශාවෙන්

✷ **රූප සටහන ඇසුරින් ප්‍රශ්න අංක 08 හා 09 සඳහා පිළිතුරු සපයන්න.**



A , B, C යන භාජන තුනක් ජලයෙන් පිරී ඇත. A භාජනයේ ජලය මෙන් දෙගුණයක් ජලය B භාජනයේ ද A භාජනයේ මෙන් තුන් ගුණයක් ජලය C භාජනයේ ද ඇත.

08. C භාජනයේ තිබිය හැකි ජල ප්‍රමාණය කුමක් විය හැකි ද?

1. 4 *l* 2. 8 *l* 3. 12 *l*

09. A භාජනයේ හා B භාජනයේ ඇති ජල ප්‍රමාණවල එකතුව C භාජනයේ ජල ප්‍රමාණයට

1. වඩා වැඩිය 2. සමාන ය 3. වඩා අඩු ය

✷ **එක්තරා ක්‍රීඩා උත්සවයක දී වෘත්තාකාර ක්‍රීඩා පිටිය වටා මීටර 5 න් 5 ට රතු , නිල් , කොළ , කහ කොඩි සිටුවන ලදී. ක්‍රීඩා පිටිය වටා මුළු දිග ප්‍රමාණය මීටර 150 කි.**


10. ක්‍රීඩා පිටිය වටා සමාන ප්‍රමාණ ඇත්තේ කුමන පාට කොඩි වර්ග ද?

1. රතු සහ කොළ 2. රතු සහ නිල් 3. නිල් සහ කොළ

11. දෙවැනි සහ තිස්වෙනි කොඩියේ පාට මොනවා ද?

1. රතු සහ කොළ 2. නිල් සහ කහ 3. නිල් සහ නිල්

12. පහත රූපය ඇසුරින් නිවැරදි පිළිතුර තෝරන්න.



1. වෘත්ත මෙන් දෙගුණයක් ත්‍රිකෝණ ද ත්‍රිකෝණ මෙන් අඩක් සෘජුකෝණාස්‍ර ද ඇත.
2. වෘත්ත මෙන් දෙගුණයක් සෘජුකෝණාස්‍ර ද සෘජුකෝණාස්‍ර මෙන් හරි අඩක් ත්‍රිකෝණ ද ඇත.
3. වෘත්ත දෙකක් ද ත්‍රිකෝණ තුනක් ද සෘජුකෝණාස්‍ර 5 ක් ද ඇත.


13. කැවුම් ගෙඩි 60 ක් සකස් කර ගැනීම සඳහා හාල් පිටි 1kg ක් සහ සීනි 1200g ක් අවශ්‍ය නම් කැවුම් ගෙඩි 45ක් සාදා ගැනීමට අවශ්‍ය සීනි හා පිටි ප්‍රමාණය කොපමණ ද?

1. හාල් පිටි 700g හා සීනි 800g
2. හාල් පිටි 750g හා සීනි 900g
3. හාල් පිටි 800g හා සීනි 750g

14. පහත සඳහන් සංඛ්‍යා පටිය ඇසුරු කර ගෙන, එක ළඟ පිහිටි සංඛ්‍යා දෙකක් එකතු කළ පසු එකතුව 12 වන අවස්ථා ගණන වන්නේ.

6	4	8	7	5	7	9	1	3	9	6	6	7	5


1. 5යි 2. 6යි 3. 7යි

15. 


පහත සඳහන් භාජනයේ ජලය ලීටර 800 ක් ඇත. A හා B ජල කරාම දෙකකි. A ජල කරාමයෙන් මිනිත්තුවකට ජලය ලීටර 40 ක් ද B ජල කරාමයෙන් තත්පර 30 කට ජලය ලීටර 80 ක් පිටතට යයි. එකවරම ජල කරාම දෙක විවෘත කළ පසු භාජනය හිස්වීමට ගතවන කාලය කොපමණ ද?

1. මිනිත්තු 4 2. මිනිත්තු 5 3. මිනිත්තු 6

✷ **ප්‍රශ්න අංක 16 හා 17 රටාව හඳුනාගෙන හිස්තැනට ආ යුතු පිළිතුර තෝරන්න.**

16. 

1. 10 2. 1 3. 5

17. 

1. 48 2. 64 3. 68

18. ඔලිම්පික් ක්‍රීඩා උළෙල පැවැත්වෙන්නේ සෑම අවුරුදු 4කට වරකි. 2020 වර්ෂයේ පවත්වනු ලැබුවේ 31 වෙනි ඔලිම්පික් ක්‍රීඩා උළෙලයි. එසේ නම් 26 වෙනි ඔලිම්පික් ක්‍රීඩා උළෙල පැවැත්වූයේ කිනම් අවුරුද්දේ ද?

1. 1996 2. 2000 3. 2004

19. නගර කිහිපයක දුර කිලෝමීටරවලින් පහත දැක්වේ. ඒ අනුව කෑගල්ලේ සිට මාතරට ඇති දුර කොපමණ ද?

		ගාල්ල	මාතර
	කොළඹ	116	161
කෑගල්ල	77	193	..?..

1. 206 km 2. 354 km 3. 238 km

✷ **අද සිකුරාදා ය. කුසුමලතා නුවර ගියේ පළමුදා ය. ඉන් අනිද්දා දිනය වන්නේ 20 වැනිදා ය. එදින කුසුමලතාගේ නංගීගේ උපන් දිනය යි.**

20. කුසුමලතා නුවර ගිය දිනය හා දවස කවදා ද?

1. 14 අඟහරුවාදා 2. 14 බදාදා 3. 15 බදාදා

21. කුසුමලතාගේ නංගීගේ උපන්දිනය යෙදෙන දවස කවදා ද?

1. ඉරිදා 2. සඳුදා 3. අඟහරුවාදා


22. තම පන්තියේ දරුවන්ගේ තොරතුරු රැස් කිරීමට සුමේදා ගුරුතුමියට අවශ්‍ය විය. පන්තියේ ළමයෙකු නැඟිට මෙසේ ප්‍රකාශ කරන ලදී. " මට ඉන්නේ අක්කා කෙනෙකුයි අයියා කෙනෙකුයි විතරයි. අපේ අම්මට පුතෙකුයි දුවලා දෙන්නෙකුයි ඉන්නවා" ඒ අනුව මෙම ළමයා එම පවුලේ කවුරුන් විය හැකි ද?

1. වැඩිමහල් දියණිය වේ. 2. බාල දියණිය වේ. 3. බාල පුතා වේ.

23. එක්තරා පැණි බීම කම්හලක පළමු දිනයේ බීම බෝතල් 50 ක් නිෂ්පාදනය කළ අතර දෙවන දිනයේ පළමු දිනයට වඩා පැණිබීම බෝතල් 10 ක් වැඩිපුර නිෂ්පාදනය කරන ලදී. මේ ආකාරයට සෑම දිනක දී ම පෙර දිනයට වඩා බීම බෝතල් 10 ක් වැඩිපුර නිෂ්පාදනය කරයි. ඒ අනුව එම ආයතනයට මුල් දිනයේ සිට බීම බෝතල් 450 ක් නිෂ්පාදනය කිරීමට දින කීයක් ගත වේද?


1. දින 5 2. දින 6 3. දින 7

24. රූපයේ ඇත්තේ එකම තරාදියකින් කොමඩු ගෙඩියක් ගස්ලබු ගෙඩියක් හා අඹ ගෙඩියක් බර මනින ලද අවස්ථා තුනකි. වැරදි ප්‍රකාශය තෝරන්න.



1. අඹ ගෙඩියේ බර මෙන් දෙගුණයක් ගස්ලබු ගෙඩියේ බර ද, අඹ ගෙඩියේ බර මෙන් තෙගුණයක් කොමඩු ගෙඩියේ බර ද වේ.
2. ගස්ලබු ගෙඩියේ බර මෙන් දෙගුණයක් කොමඩු ගෙඩියේ බර ද, අඹ ගෙඩියේ බර මෙන් දෙගුණක් බර ගස්ලබු ගෙඩියේ බර ද වේ.
3. අඹ ගෙඩියේ සහ ගස්ලබු ගෙඩියේ බරවල එකතුවට කොමඩු ගෙඩියේ බර සමානයි.

25. සමචතුරස්‍රයක් ලබා ගත හැකි වන්නේ පහත ඒවායින් කුමන හැඩ තුන සම්බන්ධ කිරීමෙන් ද?



1. A,B සහ C 2. A,C සහ D 3. A,D සහ E


26. 24 m ක් දිග රිබන් පටියක් සමාන කැබලි ලැබෙන සේ දෙකට නවා ඉන් පසු ලැබෙන ප්‍රමාණය සමාන කොටස් දෙකකට කැපුවේ නම් ලැබෙන දිග ම කැබැල්ලේ දිග කොපමණ ද?

1. 6 m 2. 8 m 3. 12 m

27. වෘත්තාකාර ධාවන පථයක සිතාරී හරි මැද සිට ගනියි. සිතාරිට උතුරු දිශාවෙන් නයනි සිටින අතර දකුණු දිශාවෙන් මලී සිටියි. සිතාරිට නැගෙනහිර දිශාවෙන් සකුණි සිටින අතර බටහිර දිශාවෙන් සිතුමි සිටියි. නයනි සහ සකුණි අතර හරි මැද ජනිතා සිට ගනියි. ඒ අනුව නිවැරදි පිළිතුර තෝරන්න.

1. ජනිතාට ඊසාන දිශාවෙන් සිතාරි සිටියි.
2. සිතුමිට බටහිර දිශාවෙන් සිතාරි සිටියි.
3. සිතාරිට ඊසාන දිශාවෙන් ජනිතා සිටියි.


28. මෙම රූපය තුළ ඇති ත්‍රිකෝණ ගණන සහ චතුරස්‍ර ගණන පිළිවෙළින්



1. 8 සහ 12
2. 6 සහ 10
3. 6 සහ 12

✷ **29 සහ 30 ප්‍රශ්නවලට රටාව අනුව පිළිතුරු සපයන්න.**


29.






මෙම රටාව ඉදිරියට කරගෙන යාමේ දී අංක 3 රූපයට සමාන රූපයක් නැවත ලැබෙන්නේ කුමන අංකවල දී ද?

1. 6 සහ 9 2. 7 සහ 11 3. 8 සහ 12

30.



1. 
2. 
3. 

✷ **ශාලාවක පුටු තබා ඇත්තේ වෘත්තාකාරව ය. එහි පුටු තබා ඇත්තේ වට දෙකක් සෑදෙන සේ ය. පළමු වටයේ අංක 1 පුටුවට ඉදිරියෙන් අංක 10 පුටුව තබා ඇති අතර දෙවන පේළියේ පුටු තබා ඇත්තේ පළමු පේළියේ අංක 1 පුටුවට පිටුපසින් අංක 19 පුටුව වන ලෙසට ය. පළමු වටයේ සෑම පුටුවක් පිටු පසින් ම දෙවන වටයේ පුටු සමානව තබා තිබුණේ නම්,**


31. පළමු පේළියේ 12 වන පුටුවට පිටු පසින් තබා ඇති පුටුවට හිමි අංකය කුමක් ද?

1. 28 2. 30 3. 32

32. රවුම් දෙකේ ම ඇති මුළු පුටු ගණන කීය ද?


1. 36 2. 38 3. 40

33. විශාල ත්‍රිකෝණයක් ඇඳ ඇත. එම විශාල ත්‍රිකෝණය තුළ රූපයේ පරිදි උඩ ම පේළියේ ත්‍රිකෝණ 1කි. ඊළඟ පේළියේ ත්‍රිකෝණ 3කි. ඊළඟ පේළියේ 5කි. මේ ආකාරයට කුඩා ත්‍රිකෝණ යොදා විශාල ත්‍රිකෝණය තුළ අඳින ලද කුඩා ත්‍රිකෝණ ප්‍රමාණය 64කි. එසේ නම් එම විශාල ත්‍රිකෝණයේ යට ම පේළියේ පමණක් ඇති ත්‍රිකෝණ ගණන කීය ද?



1. 13
2. 15
3. 17

✷ පහත සඳහන් රූපයේ ඇති පිටත වෘත්තය දකුණු අත පැත්තට ද අතුළත වෘත්තය වම් අත පැත්තට ද කරකැවිය හැකි ලෙස නිර්මාණය කර ඇත. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.



34. මෙහි ඇතුළත ඇති වෘත්තය පමණක් ස්ථාන 5ක් කරකැවූ විට E අක්ෂරයට පිටතින් ඇති සංඛ්‍යාව කුමක් ද?

1. 05 2. 40 3. 35

35. ඉහත රූපයේ ඇති පිහිටීමේ සිට පිටත වෘත්තය පමණක් ස්ථාන 6ක් කරකවා නතර කළ විට අංක 30ට ඉදිරියෙන් තිබිය යුතු ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?

1. C 2. E 3. D

* **පහත ඔරලෝසු මුහණත ඇසුරින් 36 සහ 37 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




36. ජපානයේ වේලාව ශ්‍රී ලංකාවේ වේලාවට වඩා පැය 8 ක් අඩු ය. නිතර ම පැයක් ප්‍රමාද ව පෙන්නුම් කරන මේ ඔරලෝසුවේ දැක්වෙන වේලාව පස්වරු 6.30 වන විට ජපානයේ වේලාව කීය ද?

1. ප.ව. 11.30 2. පෙ.ව. 11.30 3. පෙ.ව. 12.30

37. ජපානයේ වේලාව පස්වරු 3.30 වන විට මෙම ඔරලෝසුවේ පෙන්වන වේලාව වනුයේ,

1. ප.ව. 10.30 2. පෙ.ව. 11.30 3. ප.ව. 11.30

38. පහත දැක්වෙන තහඩු කැබැල්ලෙහි අඳුරු කළ කොටස කපා ඉවත් කරන ලදී. ඉතුරු කොටස් හතරෙහි වටේ මුළු දිග, කපා ඉවත් කර ගත් කොටසෙහි වටේ මුළු දිගට වඩා,




1. වැඩි ය
1. අඩු ය
3. සමාන ය

39. අක්කා මට රතු මල් සහ කහ මල් සමාන ප්‍රමාණයක් ගෙනවිත් දුන්නා ය. නංගීට ද මගේ මල් ප්‍රමාණයෙන් හරි අඩක් ලැබෙන සේ එම පාට දෙකෙන් සමාන ගණනක් අක්කා දුන්නා ය. අප දෙදෙනාට ම ලැබුණු මල් ගණන 24කි. මට ලැබුණු රතු මල් ගණන කීය ද?

1. 12 2. 16 3. 8

40. තෑගි පාර්සලයක් වටා නූලක් ගැට ගසා ඇති අයුරු කඩ ඉරිවලින් පහත දැක් වේ. එම නූල දිග හැරිය විට එහි මුළු දිග කීය ද?



1. 140 cm
2. 120 cm
3. 160 cm

සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2024

5 ශ්‍රේණිය

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන පහ ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

II පත්‍රය

කාලය පැය 01 යි මිනිත්තු 15 යි

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **61** ක් ඇත. සමහර ප්‍රශ්නවල අනු කොටස් ද ඇත.
- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවල **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
- පිළිතුරට යටින් ඉරක් ඇඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් ඇඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
අවසාන ලකුණු	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව සහතික කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය.	V/II/S/CH

ලබා දෙන දිනය - 2024.06.11. *පෙ.ව. 08.30 සිට පෙ.ව. 9.45* *[දෙවැනි පිටුව බලන්න.*

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි -

01. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එදා නිෂාන්ගේ අප්පච්චිගේ කුඹුරේ ගොයම් කපන දවසක් විය. මමත් අරිතත් කුඹුරේ ගොයම් කපනවා බැලීමට ගියෙමු. අප එහෙ යන විට අනෙක් යහළුවෝ පැමිණ ගොයම් කපන දෙස බලා සිටියෝ ය. එක් පැත්තක ගෙවිලියෝ ගොයම් කැපූහ. තවත් පැත්තක ගොවියෝ ගොයම් කැපූහ. ගෙවිලියෝ ගොයම් කවි තාලයට ගායනා කළෝ ය. නැන්දලා නියර දිගේ ඇඹුල රැගෙන ආවෝ ය.

1. එදා දවස කුමන දවසක් ද?.....
2. අරිත සහ යහළුවා කුමක් බැලීමට ගියේ ද? .....
3. ඔවුන් එහෙ යන විට අනෙක් යාළුවෝ කුමක් දෙස බලා සිටියෝ ද?

   .....

4. ඉරි ඇඳි වාක්‍ය ඒක වචනයට හරවා නැවත ලියන්න.

   .....

5. ගෙවිලියෝ ගොයම් කපන අතරේ ගායනා කළේ මොනවා ද?

   .....

6. ඡේදයේ සඳහන් සඤ්ඤක අක්ෂරයක් යෙදුණු වචනයක් ලියන්න.....

02. පහත එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි අක්ෂර සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

1. ඇනවුම් , ඇණවුම් , ඇණව්ම්
2. උච්චාරණය , උච්ඡාරණය , උච්චාරනය
3. ඉනිමග , ඉනිමඟ , ඉණිමග

03. පහත පදවල අදහස ලියන්න.

පැළපත :- .....

අබිමුවට :- .....

04. පහත එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

1. තද වර්ෂාවෙන් ගංගා පිටාර ගැලුවෝ ය. (.....)
2. නංගිලා ශ්‍රී පාදය වන්දනා කරති. (.....)
3. මම මිහිරි ගීත ගායනා කළෙමි. (.....)
4. ඔවුන් වෙල් එළියේ සෙල්ලම් කළහ. (.....)
5. බල්ලෙක් හාවෙකු පසුපස දිව යයි. (.....)

05. පහත සඳහන් වාක්‍යය අතීත කාල බහුවචනයට හරවා ලියන්න.

අම්මා ඉඳිආප්ප පිළියෙල කරයි.

.....

06. **දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් ලියන්න.**

ක්‍රියාත්මක / මීටර / බාලිකා / දැන් / වන්නේ / තරගය / දිවීමේ / යි / සියය / පිටියේ / දුර

.....

07. **ගැළපෙන විරාම ලකුණු යොදා වාක්‍ය නැවත ලියන්න.**

ගෙවත්තක අසිරිය චිත්‍ර රචනා පෝස්ටර් තරගය 2024 05 31 පැවැත්වෙයි

.....

08. 1. **පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තිත් ඉර මත ලියන්න.**

ගැළපෙන අදහස් හා ගතිගුණ තිබීම.

.....

2. **පහත සඳහන් ප්‍රස්තා පිරුළට ගැළපෙන අදහස ලියන්න.**

මහදැනමුත්තාගේ නුවණ වගේ.

.....

09. **පහත සඳහන් එක් එක් වචනයට ගැළපෙන සමානාර්ථ පදය බැගින් ලියන්න.**

1. ප්‍රසිද්ධ - .....
2. නෙලුම් මල් - .....

10. **පහත සඳහන් යුගල පදය සම්පූර්ණ කරන්න.**

1. අස්සක් ..... 2. තෑගි .....


11. **පහත සඳහන් ඉඟිවැකියට ගැළපෙන අදහස ලියන්න.**


අබමල් රේණුවක් -.....

12. **එක් එක් ඉංග්‍රීසි වචනයේ අර්ථය සිංහලෙන් ලියන්න.**

1. Mosquito - ..... 2. River - .....

13. **පහත රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.**

1. 

2. 

....

14. දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

1. have / I / beak / a / red

.....

2. works / the /field / father / in / paddy

.....

15. පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.


1. වේලාව කීය ද? .....

16. පහත සඳහන් වාක්‍යයට ගැළපෙන දෙමළ වාක්‍ය සිංහල අකුරෙන් ලියන්න.

උංගළ් කදිරෙ එදු ? - .....

✷ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉරමත ලියන්න.**

17. 1. ගණක රාමුවෙන් නිරූපිත සංඛ්‍යාව අකුරෙන් ලියන්න.



.....

.....

2. දස දහසස්ථානයේ 4 , දහයස්ථානයේ 8 , සියයස්ථානයේ 2 , දහසස්ථානයේ 5 හා එකස්ථානයේ 0 ලෙස වන සංඛ්‍යාව ලියන්න. .....

18. පහත සඳහන් සංඛ්‍යාවේ පෙර හා පසු සංඛ්‍යාව හිස්තැන මත ලියන්න.

..... 40 000 .....

19. දී ඇති සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියන්න.

97 652 , 97 562 , 97 265

.....

20. යෝගට් නිෂ්පාදන ආයතන තුනක දිනක් තුළ නිෂ්පාදනය කරන ලද යෝගට් ප්‍රමාණය පහත දැක්වේ.


ආයතනයේ නම	යෝගට් ප්‍රමාණය
මිහිරි	1468
ප්‍රණීත	2389
සුමිහිරි	4000

1. දිනක් තුළ දී මිහිරි හා ප්‍රණීත ආයතනවල නිපද වූ මුළු යෝගට් ප්‍රමාණය කොපමණ ද?

.....

2. දිනක් තුළ දී සුමිහිරි ආයතනයේ යෝගට්වලට වඩා මිහිරි හා ප්‍රණීත ආයතනවල නිෂ්පාදනය කරන යෝගට් ප්‍රමාණය කොපමණ අඩු ද? .....

21. 1. පහත රූපයේ $\frac{6}{10}$ ක් අඳුරු කර දක්වන්න.



2. එම රූපයේ අඳුරු කර නොමැති කොටස මුළු රූපයෙන් කීයෙන් පංගුවක් ද? .....

3. අඹ ගෙඩි 32 කින් $\frac{3}{4}$ ක ඇති අඹ ප්‍රමාණය කොපමණද? .....

22. හිස්තැන් පුරවන්න.

පැය 12 ඔරලෝසුවේ වේලාව	පැය 24 ඔරලෝසුවේ වේලාව
පස්වරු 9.45	.....
.....	00:25

23. වන්දනා නඩයක් ගමනකින් 45km 215m ක දුරක් බස් රථයෙන් ද 68km 900m ක දුරක් දුම්රියෙන් ද ගමන් කළහ.

1. ඔවුන් බසයෙන් ගමන් කළ දුරට වඩා දුම්රියෙන් ගමන් කළ දුර කොපමණ ද?

.....

2. ඔවුන් ගමන් කළ මුළු දුර කොපමණ ද? .....

24. රටාව හඳුනාගෙන හිස්තැන් පුරවන්න.

1. 124 , ... , 142 , 151 2. 97 , 105 , ... , 121

25. පාසලක පරිත්‍යාගශීලීන් පිරිසක් විසින් සිසුන් 538කට පොත් 4 බැගින් ප්‍රදානය කළෝ ය. ඔවුන් විසින් ප්‍රදානය කරන ලද මුළු පොත් සංඛ්‍යාව කීය ද? .....

26. ශාලාවක් සැරසීමට බැලුම් බෝල 417 ක් ලබා දී තිබුණි.

1. බැලුම් බෝල තුන බැගින් පොකුරු කීයක් සෑදිය හැකි ද? .....


2. බැලුම් බෝල හතර බැගින් පොකුරු කීයක් සෑදිය හැකි ද? .....

27. පහත බිල්පත සම්පූර්ණ කරන්න.

ද්‍රව්‍ය	මිල දී ගත් ප්‍රමාණය	1kg ක මිල රුපියල් සත	වටිනාකම රුපියල් සත
අල	250 g	540 00	----------
කරවල	200 g	----------	380 00
පරිප්පු	----------	670 00	335 00
මුළු මුදල			----------

2. බිල්පත සඳහා රුපියල් 1000.00 ක මුදලක් මුදලාලිට දුන්නේ නම් ලැබෙන ඉතුරු මුදල කීය ද? .....

28. පහත දැක්වෙන හැඩතල ඇසුරින් පිළිතුරු ලියන්න.



1. හැඩතල ඇසුරින් සමමිතික රේඛා හතරක් පමණක් ඇති හැඩතලවලට අදාළ අක්ෂර මොනවා ද? .....

2. සමමිතික රේඛා තුනක් සහ දෙකක් පමණක් ඇති හැඩතලවලට අදාළ අක්ෂර පිළිවෙළින් මොනවා ද? .....

29. තරාදියක එක් තැටියක මාළු කුරියෙක් සහ 100g සහ 50g පඩි දෙකක් ද අනෙක් පස තැටියේ 2 kg පඩිය ද දමා සමබර කරන ලදී. මාළු කුරියාගේ බර කොපමණ ද? .....

✷ **ප්‍රශ්න අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුරු දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

30. ශ්‍රී ලංකාවේ ඒක දේශික ශාක කාණ්ඩයට අයත් වේ,
1. ගොඩපර , කැකුණ , රඹුටන්
2. හීන්බෝවිටියා , දෝතලු , අඹ
3. ගිරිතිල්ල , දියපර , ආරිද්ද

31. හිරු එළියෙන් ලැබෙන රශ්මිය නිසා ජලය වාෂ්පවීම ප්‍රයෝජනයට ගනු ලබන අවස්ථාවකි.
1. මාළුවලින් කරවල සෑදීම
2. පලතුරුවලින් බීම සෑදීම
3. එළවළු වලින් සුප් සෑදීම

32. ජාතික කොඩියේ කහ පැහැති සිංහ රූපයෙන් සංකේතවත් වන්නේ
1. ජාතික අභිමානය
2. සිංහල ජාතිය නියෝජනය කිරීම
3. ජාතික සමගිය නියෝජනය කිරීම

33. මින්නේරිය වැව සහ අභය වැව සෑදූ රජවරුන් පිළිවෙළින්
1. ධාතුසේන රජු හා පණ්ඩුකාභය රජු
2. මහසෙන් රජු හා පණ්ඩුකාභය රජු
3. පණ්ඩුකාභය රජු හා මහසෙන් රජු

34. ලී කැටයම් සහ රූකඩ කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලන නගර පිළිවෙළින් දැක්වෙන්නේ,
1. පිළිමතලාව සහ අම්බලන්තොට
2. ඇම්බැක්ක සහ අම්බලන්ගොඩ
3. කඩුගන්නාව සහ අම්බලන්ගොඩ

35 පරිසරයේ ඇති ගස් අතරින් ජල උල්පත් විශාල ප්‍රමාණයක් ආරක්ෂා කරන ගසකි.
1. කුඹුක් ගස 2. මී ගස 3. කොස් ගස

36. මාර්ග ආලෝක සංඥා පූවරුවක රතු පැහැති බල්බය දැල් වී ඇති විට
1. වාහනය නවත්වන ලෙසයි
2. වාහනය ධාවනය කරන ලෙසයි
3. වාහනය ධාවනයට සුදානම් වන ලෙසයි

37. ශ්‍රී ලංකාවේ උසම කන්ද සහ උස ම දිය ඇල්ල පිළිවෙළින්,
1. කිරිගල්පොත්ත සහ බඹරකන්ද
2. බඹරකන්ද සහ දියලුම
3. පිදුරුතලාගල සහ බඹරකන්ද

38. වගා ආරක්ෂා වීම සඳහා සිදුවන ස්වභාවික ක්‍රියාවක් වන්නේ කුමක් ද?
1. පිටි මකුණන් සඳහා සබන් වතුර යෙදීම
2. ඇටි කුකුළන් විසින් ගොළුබෙල්ලන් ආහාරයට ගැනීම
3. කොහොඹ ඇට තළා සාදාගත් දියර ඉසීම

39. වායව පරිසරයේ ජීවත්වන සතුන් ඇතුළත් පිළිතුර වන්නේ ,
1. පැස්බරා, බත්කුරා 2. පළගැටියා, සමනලයා 3. සමනලයා, බල්ලා


40. ශ්‍රී ලංකාවේ ආරම්භ වූ පළමු අධිවේගී මාර්ගය කුමක් ද?
1. කටුනායක අධිවේගී මාර්ගය 2. දක්ෂිණ අධිවේගී මාර්ගය
3. කොළඹ - නුවර අධිවේගී මාර්ගය

41. ධීවර කර්මාන්තයේ භාවිත කරන උපකරණ වන්නේ ,
1. කෙමනය, අතංගුව, වරක්කලය
2. වියගහ, නඟුල, කෙමනය
3. මා දැල, විසි දැල, කෙමනය

42. මාලිමා යන්ත්‍රයෙන් ඇති ප්‍රයෝජනයක් වන්නේ,
1. පහසුවෙන් මාර්ග සොයා ගත හැකි වීම.
2. පහසුවෙන් දිශාව සොයා ගත හැකි වීම.
3. සුළඟේ වේගය මැන ගත හැකි වීම.

43. අතීතයේ අපේ රට යටත් කරගෙන සිටි විදේශීය ජාතීන් පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,
1. ඉංග්‍රීසි, ලන්දේසි, පෘතුග්‍රීසි
2. පෘතුග්‍රීසි, ඉංග්‍රීසි, ලන්දේසි
3. පෘතුග්‍රීසි, ලන්දේසි, ඉංග්‍රීසි

44. **"අහසින් වැටෙන එක ජල බිඳුවක් හෝ අපතේ නොයවා ප්‍රයෝජනයට ගත යුතු ය"**. යන ප්‍රකාශය කළ රජතුමා වන්නේ,
1. මහසෙන් රජතුමා 2. දුටුගැමුණු රජතුමා 3. මහා පරාක්‍රමබාහු රජතුමා

45. 

මෙම පරීක්ෂණය මඟින් නිරීක්ෂණය වූයේ කුමක් ද?
1. කුඩළු ශාකය මැලවී ඇති බව.
2. කුඩළු ශාකය පාට කළ ජලය උරා ගෙන ඇති බව.
3. කුඩළු ශාකයට කිසිදු වෙනසක් සිදු වී නොමැති බව.

46. 

මෙම ක්‍රියාකාරකම මඟින් නිරීක්ෂණය කරන ලද්දේ කුමක් ද?
1. පණුවන් කතුරුමුරුංගා කොළ කන ආකාරය
2. සමනලයාගේ ජීවන චක්‍රයේ එක් අවස්ථාවක්
3. පණුවන් බිත්තරයෙන් එළියට එන ආකාරය

47. රත් වූ යමක් ඇල්ලීමට යොදා ගන්නා උපකරණවල විශේෂත්වය වන්නේ,
1. උපකරණය ප්‍රමාණයෙන් විශාල වීම.
2. උපකරණයේ ලී මිටක් තිබීම.
3. උපකරණයේ ලෝහ මිටක් තිබීම.

48. විශාල ජලාශවල වේල්ල හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ,
1. වේල්ලෙන් පාමුල පීඩනය ඉහළට වඩා අඩු ය
2. වේල්ලෙන් පාමුල පීඩනය ඉහළට වඩා වැඩි ය.
3. වේල්ලේ පාමුල පීඩනය හා ඉහළ පීඩනය සමාන වේ.

49. ජලය සහිත වීදුරු බඳුනකට අයිස් කැට දැමූ විට සිදුවන්නේ,

A - ජලයේ උෂ්ණත්වය අඩු වී සිසිල් වේ.

B - වීදුරුවේ පිටත සිසිල් වී අවට වාතය ජලය බිංදු ආකාරයට වීදුරුවේ පිටත තැන්පත් වේ.

1. A පමණක් සත්‍ය වේ. 2. B පමණක් සත්‍ය වේ. 3. A හා B සත්‍ය වේ.

50. අපිරිසිදු ජලය පානය කිරීමෙන් වැළඳෙන රෝග පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
1. උණ සන්නිපාතය , කොළරාව , කහ උණ 2. උණ සන්නිපාතය , කහ උණ , මහමාරිය
3. කහ උණ , ඩෙංගු , උණ සන්නිපාතය

51. **"ඉර දෙවියන්ගේ ඉර ගල ගාවා - සඳ දෙවියන්ගේ සඳ ගල ගාවා..."** යන කවිය ගායනා කරනුයේ,
1. පැල් රැකීමේ දී 2. පතල් කැපීමේ දී 3. ගොයම් කැපීමේ දී

52. තිරස් සහ සිරස් පෘෂ්ඨවල එක සේ ගමන් කළ හැකි සතෙකු වන්නේ,
1. හූනා 2. ගැඩවිලා 3. පූසා

53. වඩු කර්මාන්තයේ දී ලෑල්ලක් නිවැරදිව කැපීමට උවමනා රේඛා ඇඳ ගැනීමට යොදා ගන්නේ,
1. කියත 2. යවකාරය 3. වරක්කලය

54. අපි මිල දී ගන්නා භාණ්ඩවල නිතර දක්නට ලැබෙන ප්‍රමිති සහතික දෙකක් වන්නේ,

1. ISO – OSL 2. LSO – VPN 3. ISO – SLS

55. කුසගින්න නොදැනීම, සම ඉරිතැලීමට, කටකොන් වන වීම යන රෝග ලක්ෂණ ඇති වන්නේ,


1. විටමින් C ඌනතාවය නිසා.
2. විටමින් B ඌනතාවය නිසා.
3. විටමින් D ඌනතාවය නිසා.

56. සතුන්ගේ පැවැත්ම උදෙසා හානිදායක ලෙස මිනිසා විසින් සිදු කරන ක්‍රියාකාරකම් දෙකක් වන්නේ,

1. ඉඳුල් වතුර බිම දැමීම , තණකොළ කැපීම.
2. උණු වතුර බිම දැමීම , රසායනික පොහොර යෙදීම.
3. බීජ සිටුවීම , කාබනික පොහොර යෙදීම.

57. පස් නියැදියක් ගෙන විනිවිද පෙනෙන බඳුනකට දමා සොලවා මඳ වේලාවක් තබා බැලූ විට දැකිය හැකි වන්නේ,

1. ජලයේ පාවෙන ද්‍රව්‍ය 2. අවර්ණ ජලය 3. ජලය වාෂ්ප වී ඇති බව

58. 

මෙම භාජන තුනට අයිස් කැටය බැගින් දමා ඇත. මෙයින් වඩාත් සෙමින් අයිස් කැටය දියවන්නේ කුමන භාජනයේ ද?

1. A
2. B
3. C

59. ඉන්ධන සහිත ස්ථානයක හදිසි ගින්නක් ඇතිවුවහොත් එය නිවා දැමීමට වඩාත් සුදුසු වන්නේ,

1. සනකම් රෙදිවලින් ගින්න වැසීම.
2. වතුර දමා ගින්න නිවා දැමීම.
3. වැලි දමා ගින්න නිවා දැමීම.

60. **''අපේ ගමට ගං වතුර ඇවිල්ලා....''** යන මැයෙන් වචන පහකට වැඩි වාක්‍ය 3 ක් ලියන්න. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු යි.

1. .....

.....

2. .....

.....

3. .....

.....